# ජාතික සංවර්ධන බැංකු මූල්‍ය සේවා

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ කර්මාන්ත හා ව්‍යාපාර මූල්‍ය ණය පහසුකම් සපයන ජාතික සංවර්ධන බැංකුව ලංකාවේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ප්‍රධානතම බැංකු ආයතනයද වේ. එම බැංකුව මගින් සපයන මූල්‍ය ණය පහසුකම් පිළිබඳ මෙවර කර්මාන්ත සඟරාවෙන් අපි ඔබ දැනුවත් කරන්නෙමු.

ලංකාවේ විවිධ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරමින් බැංකු හා මූල්‍ය ආයතන ගණනාවකට තොග වශයෙන් මූල්‍ය ණය පහසුකම් - සපයන ජාතික සංවර්ධන බැංකුව දේශයේ සංවර්ධනය සඳහා ණය යෝජනා රාශියක් සැලසුම් කිරීමට හා ව්‍යුහගත කිරීමට ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා රජයේ අනුග්‍රහය දැක්වීමට සහභාගී වී ඇත.

## ව්‍යාපෘති ණය

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හා සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය වන අරමුදල් ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර වාහන වැනි වත්කම් මිලට ගැනීමට සපයා දීම සහ අවශ්‍ය දිගු කාලීන ප්‍රාග්ධනය හෝ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වුවද මූල්‍ය ණය පහසුකම් ලබා ගැනීමට හැකියාව ඇත.

## කල්බදු පහසුකම්

අරමුදල් යෙදවීමකින් තොරව යන්ත්‍ර සූත්‍ර හා ව්‍යාපාර උපකරණ වාහන වැනි ස්ථාවර වත්කම්, සරල ලෙස අඩුම පොලී අනුපාතයක් යටතේ නම්‍යශීලී කොන්දේසි මත ලබාදීම.

## වෙළෙඳ ණය

භාණ්ඩ ආනයනය සඳහා එම ව්‍යාපාරිකයින්ට ණයවර ලිපි, නැව්ගත කිරීම, ඇපකර නිකුත් කිරීම, විදේශ විනිමය පිළියෙළ කරදීම , වෙළෙඳ ණය පහසුකම් මගින් ලබාදීමේදී විශේෂයෙන්ම කාරක ප්‍රාග්ධන හිඟයක් පියවා ගැනීමට පහසුකම් ලබාදීම වැදගත් වේ.

## සුළු හා මධ්‍ය පරිමාණ ණය

සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර, කර්මාන්ත සඳහා යන්ත්‍ර සූත්‍ර උපකරණ වැනි වත්කම් මිලට ගැනීමට මෙන්ම අමු ද්‍රව්‍ය සපයා ගැනීම වැනි කාරක ප්‍රාග්ධනය සඳහා ද ණය ලබාදීම සිදු කෙරේ. ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය ශාඛා කාර්යාල මගින් මෙම පහසුකම් ලබාදීම සිදු කෙරේ.

## ක්‍රියාත්මක කෙරෙන ණය යෝජනා ක්‍රම

(1) දසුන :- මේ ව්‍යාපෘති ණය දකුණු පළාතේ ගාල්ල, මාතර, හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කෙරේ. ඉදිරි වසර හය තුළ ඉතා කුඩා ව්‍යාපාර 7000 ක් සහ සුළු ව්‍යාපාර 1500 ක් සඳහා ණය මුදල් සපයනු ඇත. පෞද්ගලික අංශයේ ව්‍යාපාර වලට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම හැර අනෙකුත් වත්කම් පිරිවැය රුපියල් 500,000/- ට අඩු ව්‍යාපාර කුඩා ව්‍යාපාර ලෙසද රු. 700,000/- ට අඩු ව්‍යාපාර සුළු ව්‍යාපාර ලෙස ද සලකනු ඇත.

ණය ප්‍රමාණය :- අවම රු. 40,000/-
උපරිම රු. 5,600,000/-

ණය ආපසු ගෙවීමේ කාලය :- සහන කාලය ද ඇතුළුව අවුරුදු 3 - 7 දක්වා සහන කාලය මාස 24 දක්වා.

සුරැකුම් :- සාමාන්‍යයෙන් ව්‍යාපාරයේ වත්කම් වල උකස පියවා ගැනීමට

## 1. මිරිදිය සම්පත් ණය යෝජනා ක්‍රමය

දිවයිනේ මිරිදිය ආශ්‍රිත ධීවර හා ජලජීවී වගා කටයුතු කළමනාකරණය තුළින් වෙළඳපොළ පදනම මත විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම හා දරිද්‍රතාවය අවම කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘති ණය පහසුකම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ට බැංකු හරහා ලබාගත හැකිවේ.

## ක්‍රියාත්මක දිස්ත්‍රික්ක

අනුරාධපුර, මඩකලපුව, මාතලේ, පොළොන්නරුව, අම්පාර, හම්බන්තොට, මොණරාගල, පුත්තලම, බදුල්ල,

කුරුණෑගල, නුවරඑළිය, රත්නපුර, ත්‍රිකුණාමලය හා වව්නියාව සහ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මකයි.

ණය මුදල :- ව්‍යාපාතියේ වියදමින් 75% නොඉක්මවන පරිදි, උපරිම රුපියල් මිලියන 10 කි.

ණය ආපසු ගෙවීම :- අවුරුදු 3 සිට 5 දක්වා.

සහන කාලය :- උපරිම මාස 12 කි.

## 2. කුඩා හා ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය :-

නිෂ්පාදන, සේවා හා වෙළඳ ව්‍යාපාර සඳහා ස්ථාවර වත්කම් සහ ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය / කල් බදු පහසුකම් ලබාදෙන මෙම ණය පහසුකම් වාර්ෂික පොලී අනුපාතය 10.5 % කි. ව්‍යාපෘති පිරිවැයෙන් උපරිම 75% ක් දක්වා උපරිම රුපියල් 500,000/- ණය පහසුකම් සපයනු ලබයි. හිමිකරුගේ දායකත්වය අවම වශයෙන් 25% අපේක්ෂා කෙරේ. සහන කාලයද ඇතුළුව ණය ආපසු ගෙවීමේ කාලය වසර 05 කි. සහන කාලය උපරිම මාස 12 කි.

## සුවන 1 චක්‍රීය අරමුදල

සුවන 1 චක්‍රීය අරමුදල යටතේ ණය දෙන බැංකු සහ අනුමත ණය දෙන ආයතන මගින් සුළු කර්මාන්තවලට සපයනු ලබන ණය සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමට ජාතික සංවර්ධන බැංකුව කටයුතු කරයි.

## සුවන 1 චක්‍රීය අරමුදල

### 1. හැඳින්වීම :-

1.1 ජාතික සංවර්ධන බැංකුව " සුවන 1 චක්‍රීය අරමුදල" යටතේ එයට සහභාගී වන ණය දෙන ආයතන මගින් සුළු කර්මාන්ත වලට සපයනු ලබන ණය සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමේ සමාරම්භය සතුටින් නිවේදනය කර සිටී. අන්තර් ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන බැංකුව මගින් මූල්‍යනය කරන ලද සුවන 1 ණය යෝජනා ක්‍රමය යටතේ ඊට සහභාගී වූ ණය දෙන ආයතන විසින් කරන ලද ණය ආපසු ගෙවීම් වලින් සුවන 1 චක්‍රීය අරමුදල සමන්විත වේ.

1.2. දීර්ඝ කාලීන ණය මුදල් සැපයීම තුලින් සුළු කර්මාන්ත දිරි ගැන්වීම මෙම ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන පරමාර්ථය වේ. අත්‍යාවශ්‍ය කර්මාන්ත අංශ වෙනුවෙන් වෙනත් ණය ක්‍රමයක් හඳුන්වා දෙන තුරු අඛණ්ඩව දීර්ඝ කාලීන අරමුදල් සැපයීම ද වැදගත් අවශ්‍යතාවයකි. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් වසර දෙකක කාලයක් සඳහා මාසික අරමුදල් අවශ්‍යතාව රුපියල් මිලියන 100 වශයෙන් ගණන් බලා ඇති අතර, මෙම ප්‍රමාණය චක්‍රීය අරමුදලේ සම්පත් තිබේ නම් පමණක් " පළමුව පැමිණෙන්නන්ට පළමුව බෙදාදීම" යන පදනම යටතේ සහභාගී වන ණය දෙන ආයතන අතරේ බෙදා හරිනු ලැබේ.

1.3. සහභාගී වන ණය දෙන ආයතන මගින් " සුවන 1 චක්‍රිය අරමුදල" යටතේ අනුමත කරනු ලබන උප ණය මුදල් සඳහා අදාළ කොන්දේසි මෙම උපදෙස් මාලාවට අයත් වේ.

### 2. අර්ථ නිරූපනයන්

2.1. සහභාගිවන ණය දෙන ආයතන:- යනු සුවන 1 ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගී වූ සහ ලබාගත් ප්‍රතිමූල්‍ය ණය වෙනුවෙන් ජාතික සංවර්ධන බැංකුවට ණය ආපසු ගෙවීම් ආරම්භ කළ වාණිජ බැංකු, සංවර්ධන බැංකු සහ මුදල් මණ්ඩලය මගින් අනුමත අනෙකුත් ණය දෙන ආයතන/ රාජ්‍ය නොවන සංවිධානයන්ය. රජය සමග අත්සන් කළ ණය ගිවිසුම ප්‍රකාර ජාතික සංවර්ධන බැංකුවද සහභාගි වන ණය දෙන ආයතනයක් ලෙස කටයුතු කරනු ඇත.

2.2. **උප ණය මුදල** :- යනු මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ජාතික සංවර්ධන බැංකුව සමඟ අත්සන් කළ සහභාගීත්ව ණය ගිවිසුම් ප්‍රකාර සහභාගීවන ණය දෙන ආයතනයන් විසින් අනුමත කළ ණය මුදලකි.

2.3. **උප ව්‍යාපෘතිය** : යනු මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගී වන ණය දෙන ආයතනයක් විසින් උපණය මුදලක් අනුමත කළ හෝ අනුමත කිරීමට යෝජිත ව්‍යාපෘතියකි.

2.4. **ප්‍රතිමූල්‍ය ණය** :- යනු මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන උප ව්‍යාපෘතියක් සඳහා සහභාගීවන ණය දෙන ආයතනයක් මගින් අනුමත කළ උපණය මුදලකින් සුදුසකම් ඇති කොටසක් ආවරණය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුව මගින් අනුමත කෙරෙන ණය මුදලකි.

### 3. සුදුසුකම් පිළිබඳ නිර්ණායක

#### 3.1. සුදුසුකම් ලබන උපණය

##### 3.1.1 සුදුසුකම් ලබන උප ණය කරුවන්

තනි ව්‍යාපාර , හවුල් ව්‍යාපාර, පෞද්ගලික සමාගම් සහ සමුපකාර සමිති මේ යටතේ සුදුසුකම් ලබන උප

### 3.1.2. සුදුසකම් ලබන උප අංශ :-

අවි ආයුධ, මත් ද්‍රව්‍ය, දුම්කොළ, නිෂ්පාදන සහ ගණිකා වෘත්තිය හැර, සියලුම නිෂ්පාදන හෝ සේවා කර්මාන්ත උප අංශ, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රති මූල්‍ය ලැබීමට සුදුසුකම් ලබයි.

### 3.1.3. සුදුසකම් ලබන උප ව්‍යාපෘතියක විශාලත්වය

උප ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන්, පසු ඉඩම් සහ ගොඩනැගිලි (සින්නක්කර/බදු) පිරිවැයට අමතරව එම ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් වෙනුවෙන් කරන ලද ආයෝජන රුපියල් මිලියන දහය (10) නොඉක්මවිය යුතුය. කෙසේ වුවත් ගබඩා, වාණිජ ගොඩනැගිලි, සංචාරක හෝටල්, රෝහල් වැනි මූලික ආයෝජනය ඉඩම් සහ ගොඩනැගිලි වෙනුවෙන් දැරීමට සිදුවන උප ව්‍යාපෘතින්ගේ මුළු ස්ථාවර වත්කම් වෙනුවෙන් කරන ලද ආයෝජනය ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැය ද ඇතුළත්ව රුපියල් මිලියන දහය (10) නොඉක්ම විය යුතුය.

ණය ඉල්ලුම් කරන ව්‍යාපාරය ව්‍යාපාර සමූහයකට අයත් වන්නේ නම් ව්‍යාපාර සමූහයට අයත් සියලු ව්‍යාපෘතිවල ස්ථාවර වත්කම් වල වටිනාකම උප ව්‍යාපෘතියේ විශාලත්වය තීරණය කිරීමේදී සැළකිල්ලට ගත යුතු වේ.

### 3.1.4. වාණිජ හා ආර්ථික ශක්‍යතාවය

සියලුම උප ව්‍යාපෘතීන් මූල්‍යමය වශයෙන් ශක්තිමත් විය යුතු අතර, ආර්ථිකමය වශයෙන් ද ඵලදායී විය යුතුය. උපණය මුදල් අනුමත කිරීමේදී අමතර රැකියා බිහි කිරීමේ ඉඩකඩ, දේශීය අමුද්‍රව්‍ය භාවිතය, ආදී ආර්ථික වාසී ණය දෙන ආයතනය මගින් සැලකිල්ලට ගත යුතුය.

### 3.1.5. ණය ප්‍රාග්ධන අනුපාතය

යෝජිත උප ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව උප ව්‍යාපෘතිය වෙනුවෙන් යෙදූ ප්‍රාග්ධනයෙන් අවම වශයෙන් 25% ක හිමිකරු දායකත්වය තිබිය යුතුය.

### 3.1.6. ව්‍යාපෘතියක අපේක්ෂාව

සියලුම උප ව්‍යාපෘති වලින් අමතර නිෂ්පාදන ධාරිතාවක් ඇති කිරීමක් හෝ නිෂ්පාදන ක්‍රියාකාරී මට්ටම වැඩි කිරීමක් හෝ භාණ්ඩවල තත්ත්වය උසස් කිරීමක් හෝ භාණ්ඩයක මිළ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීමක් හෝ සිදුවිය යුතුය.

### 3.1.7. පාරිසරික උපදෙස් වලට අනුකූලවීම

සියලුම උප ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ දැනට පවත්නා පාරිසරික නිති රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

## 3.2. සුදුසකම් ලබන ප්‍රතිමූල්‍ය ණය

### 3.2.1. සුදුසු පිරිවැය

උප ව්‍යාපෘතියකට අදාල වන ගොඩනැගිලි පිරිවැය, යන්ත්‍රසූත්‍ර, වෙනත් ස්ථාවර වත්කම් හා වාහන මිළදී ගැනීම සහ ස්ථාවර කාරක ප්‍රාග්ධනය අවශ්‍යතා මූල්‍යනය කිරීම

4.2.1. ඡේදයේ සඳහන් පරිදි මුළු ණය මුදලින් 70% ක උපරිමයකට යටත්ව සම්පූර්ණ වශයෙන් ප්‍රතිමූල්‍ය ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

### 3.2.2. කාරක ප්‍රාග්ධනය

නව ව්‍යාපෘතියක පළමු වර්ෂයේ මෙහෙයුම් පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය වන ස්ථාවර කාරක ප්‍රාග්ධනය සහ පුළුල් කිරීමකදී නම් පුළුල් කිරීමෙන් පසු පළමු වර්ෂයේ මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අමතර ස්ථාවර කාරක ප්‍රාග්ධන ප්‍රමාණය පමණක් වෙනුවෙන් මේ යටතේ මූල්‍ය පහසුකම් සැපයිය යුතුය. කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පමණක්ම අනුමත කළ උපණය මුදල් සහ කෙටි කාලීන හා නිතර වෙනස්වන ස්වභාවයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සපයන උපණය මුදල් ප්‍රතිමූල්‍ය ලැබීම සඳහා සුදුසුකම් නොලබයි.

### 3.2.3. ප්‍රතිමූල්‍ය සඳහා සුදුසකම් නොලබන වියදම්

පහත සඳහන් දැ ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ලැබීමට සුදුසුකම් නොලබයි.

අ. සහභාගි වන ණය දෙන ආයතනයකට හෝ වෙනත් කිසියම් සංවිධානයකට අයවීමට ඇති ණය මුදලක් පියවීම.

ආ. සාමාන්‍ය පරිපාලන වියදම්

ඇ. බදු සහ තීරු ගාස්තු

ඈ. ඉඩම් මිළදී ගැනීම

ඉ. වන්දි ගෙවීම

ඊ. කල්බදු

උ. අනෙකුත් වක්‍ර වියදම්

### 3.2.4. දින 120 සීමාව

ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් පත ජාතික සංවර්ධන බැංකුව වෙත ලැබුණ දින සිට දින 120 කට කලින් දරන ලද වියදම් ප්‍රතිමූල්‍ය කිරීම සඳහා සුදුසුකම් නොලබයි. කෙසේ නමුත් මෙම චක්‍රිය අරමුදල් යටතේ සහභාගි වන ණය ගිවිසුම් අත්සන් කිරීමට පෙර දරණ ලද වියදම් මේ යටතේ ප්‍රතිමූල්‍ය ලැබීමට සුදුසුකම් නොලබයි.

### 3.2.5. මිලදී ගැනීමේ පිළිවෙත

උප ණය මුදල් යොදාගෙන මිළදී ගනු ලබන භාණ්ඩවල මිළ ගණන් තරඟකාරී සහ සාධාරණ විය යුතු අතර, ඒවා තෝරා ගැනීම් සම්බන්ධයෙන් ණයදෙන ආයතන සෑහීමකට පත්විය යුතු වේ. භාණ්ඩවල තත්ත්වය, විශ්වාස බව, ඒවා සැපයීමට ගන්නා කාලය, අමතර කොටස් ලබා ගැනීමේ හැකියාව හා එම යන්ත්‍ර සඳහා නඩත්තු සේවා ආදී කරුණු මෙහි දී සැළකිල්ලට ගත යුතුය.

ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා එක්සත් ජනපද ඩොලර් 100,000 ට වැඩි වන අවස්ථාවලදී ජාත්‍යන්තර මිලදී ගැනීම් පිළිවෙත් අනුගමනය කළ යුතුය. මෙහිදී අඩු වශයෙන් සැපයුම්කරු වන් තිදෙනෙකුගේ මිල ගණන් සලකා බැලිය යුතුය.

දේශීය වශයෙන් අත්පත් කරගනු ලබන අළුත් වැඩියා කරන ලද හෝ පාවිච්චි කරන ලද යන්ත්‍රසූත්‍ර සම්බන්ධයෙන් ඒවායේ යෝග්‍යතාව හා වටිනාකම තහවුරු කරන පරීක්ෂණ වාර්තාවක් පිළිගත් ආයතනයකින් ලබාගත යුතුය. ආනයනය කිරීමකදී මෙම වාර්තාව සීමා සහිත ජෙනරල් සුපිරින්-ටෙන්ඩන්ස් ආයතනයෙන් හෝ වෙනත් පිලිගත් අන්තර් ජාතික තක්සේරු ආයතනයකින් හෝ අපනයනය කරනු ලබන රටේ අනුමත ආයතනයකින් ලබාගත යුතුය.

## 4. ණය කොන්දේසි

### 4.1. උපණය මුදල්

#### 4.1.1 ණය මුදලේ ප්‍රමාණය

මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාගත හැකි අවම ණය මුදල සුවන 111 සහ සුමදි යෝජනා ක්‍රම යටතේ ලබා ගෙන ඇති උප ණය මුදල් වල ගෙවීමට ඉතිරිව ඇති ශේෂයද සමග රුපියල් මිලියන 5 කට සීමා වේ.

#### 4.1.2. පොලී අනුපාතිකය

වෙළඳපොල තත්ත්වය සැලකිල්ලට ගනිමින් උපණයකරු සඳහා පොලී අනුපාතිකය නියම කිරීම සහභාගීවන ණය දෙන ආයතනය සතුය. කෙසේ නමුත් වාර්ෂික පොලී අනුපාතය ආසන්න වශයෙන් 12.3% ක් පමණ විය යුතු අතර, එය 14% නොඉක්ම විය යුතුය. සහභාගී වන ණය දෙන ආයතනය සහ ණයකරුගේ ද කැමැත්ත ඇතිව විචල්‍ය පොළී අනුපාතයක් හෝ ණය මුදල ආපසු ගෙවීමේ මුළු කාලය තුල බල පවත්වන පරිදි ස්ථාවර පොළී අනුපාතයක් තීරණය කළ හැක. විචල්‍ය පොළී අනුපාත ක්‍රමය යටතේ උපණය මුදල් සඳහා වන පොලී අනුපාතය සෑම මාස 06 කටම වරක් උද්ධමන අනුපාතයට අනුකූලව විමර්ශනය කරනු ඇත.

#### 4.1.3. ණය ආපසු ගෙවීම හා සහන කාලය

උපණය මුදල් ආපසු ගෙවීමේ සඳහා සහන කාලයක් ද ඇතුළුව අවුරුදු 3 සිට 10 දක්වා කාලයක් ලබා දිය හැකිය. උපරිම සහන කාලය මාස 24 කි. කෙසේ නමුත් සුදුසු ණය ආපසු ගෙවීමේ සහ සහන කාලයක් තීරණය කිරීමේදී සහභාගී වන ණය දෙන ආයතන විසින් ණය මුදල යටතේ ලබාගත් වත්කමෙහි ජීවිත කාලය ද සැලකිල්ලට ගත යුතු වේ. ඒ අනුව වාණිජ වාහන හෝ කෘෂිකාර්මික උපකරණ මිළදී ගැනීමේදී උපරිම ආපසු ගෙවීමේ කාලය සහන කාලය ද ඇතුළුව වසර 5 කට සීමා කළ යුතු වේ.

එබඳු ණය සඳහා සහන කාලය පිළිගත හැකි සාක්ෂි නොමැති අවස්ථාවකදී මාස 3 කට වඩා වැඩි නොකළ යුතුය.

4.1.4. **සුරැකුම්**

ව්‍යාපෘතියේ අවදානම් අනුව සුදුසු සුරැකුම් තීරණය කිරීම සහභාගී වන ණය දෙන ආයතනය සතුය. කෙසේ නමුත් මේ යෝජනා ක්‍රමය යටතේ ණය අනුමත කිරීම ව්‍යාපෘතිය පදනම් කරගෙන සිදු කරන බැවින්, ව්‍යාපෘතියේ ශක්‍යතාවය සහ ප්‍රතිමූල්‍ය ලැබීමට ඇති සුදුසුකම අනුග්‍රාහකයන් විසින් දෙනු ලබන සුරැකුම් වලට වඩා ණය තීරණය කෙරෙහි බලපායි. එබැවින් තෙවන පක්ෂයේ ඇපකරුවන් මෙම ණය සඳහා බොහෝ විට අවශ්‍ය නොවනු ඇත. ව්‍යාපෘතියේ ශක්‍යතාවය සහ එහි වත්කම් තුළින් ලැබෙන සුරැකුම් උපණය මුදල සඳහා ප්‍රමාණවත් සුරැකුම් ලෙස සැලකිය හැකිය. ව්‍යාපෘති වත්කම් අවශ්‍ය පරිදි රක්ෂණය කර ඇති බවට සහභාගී වන ණය දෙන ආයතනය, තහවුරු කරගත යුතු වේ.

4.2. **ප්‍රතිමූල්‍ය ණය**

4.2.1. **ණය මුදල**

සහභාගී වන ණය දෙන ආයතනයක් විසින් අනුමත කරනු ලබන උප ණය මුදලකින් 70% ක් ජාතික සංවර්ධන බැංකුව මගින් ප්‍රතිමූල්‍යනය කරනු ලැබේ. මෙම පදනම යටතේ උපරිම ප්‍රතිමූල්‍ය ණය මුදල රුපියල් මිලියන 3.5 කි.

4.2.2. **පොලී අනුපාතිකය**

ජාතික සංවර්ධන බැංකුව මගින් අනුමත කරනු ලබන ප්‍රතිමූල්‍ය ණය සඳහා අදාළ වන වාර්ෂික පොලී අනුපාතය 6.3% කි.

4.2.3. **ණය ආපසු ගෙවීමේ කාලය සහ සහන කාලය**

ප්‍රතිමූල්‍ය ණය මුදලේ සහන කාලය සහ ආපසු ගෙවීමේ කාලය උපණය මුදලට අදාළ ණය ආපසු ගෙවීමේ කාලය සහ සහන කාලයට සමාන්තර වනු ඇත.

4.2.4. **සහභාගී වන ණය දෙන ආයතනය මගින් උපණය මුදල අනුමත කිරීම**

ප්‍රතිමූල්‍ය අයදුම්පත් ජාතික සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කිරීමට පෙර සියළුම උපණය මුදල් සහභාගී වන ණය දෙන ආයතනය මගින් අනුමත කර තිබිය යුතුය.

5. **ප්‍රතිමූල්‍ය ණය අනුමත කිරීමේ ක්‍රියා පිළිවෙත.**

5.1. **අනුමැතිය සඳහා අදාලවන නිදහස් සීමාව**

ප්‍රතිමූල්‍ය අනුමත කිරීම සඳහා උපණය මුදල් " නිදහස් සීමාවට අඩු ණය මුදල" සහ " නිදහස් සීමාවට වැඩි ණය මුදල" වශයෙන් කොටස් දෙකකට බෙදනු ලැබේ. එකිනෙක ණයදෙන ආයතනයට අදාල සීමාවන් ජාතික සංවර්ධන බැංකුව සහ සහභාගී වන ණය දෙන ආයතන අතර අත්සන් කළ ණය ගිවිසුමෙහි සඳහන් වේ. නිදහස් සීමාව යටතේ සහභාගී වන ණය දෙන ආයතනය විසින් අනුමත කරන ප්‍රතිමූල්‍ය ප්‍රමාණය ජාතික සංවර්ධන බැංකුවේ පිළිගැනීමට යටත් වේ. උපණය මුදල් වෙනුවෙන් ප්‍රතිමූල්‍ය අනුමත කිරීමේදී සහභාගී වන ණය දෙන ආයතනයේ ප්‍රධාන කාර්යාලය අදාළ ණය මුදල මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලැබීමේ නිර්නායකවලට ගැලපෙන බව සහ අදාල සියළු කොන්දේසි කරගත යුතුය.

5.2. **අවශ්‍ය ලිපි ලේඛන**

ප්‍රතිමූල්‍ය ණය අනුමැතිය සඳහා වන සියළුම ඉල්ලුම් පත්‍ර පහත සඳහන් අනෙකුත් ලිපි ලේඛනද සමග ජාතික සංවර්ධන බැංකුවේ ප්‍රති මූල්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

අ. ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් පත්‍රයක්

ආ. ව්‍යාපෘතිය ඇගයීමේ වාර්තාවේ පිටපතක්

ඇ. උප ණය කරු විසින් සහභාගී වන ණය දෙන ආයතනයට ඉදිරිපත් කරන ලද ණය ඉල්ලුම්පතේ පිටපතක්.

5.3. **ව්‍යාපෘති ඇගයීම් වාර්තා ආකෘති**

රුපියල් මිලියන 1 දක්වා වන ණය මුදල් වෙනුවෙන් භාවිතා කළ හැකි ව්‍යාපෘති වාර්තා. රුපියල් මිලියන 1 ට වඩා වැඩි ණය මුදල් වෙනුවෙන් ව්‍යාපෘති වාර්තා පිළියෙළ කිරීමේදී ස්වාධීන ආකෘතියක් භාවිතා කිරීමට සහභාගී වන ණය දෙන ආයතන වලට ඉඩ ඇත. කෙසේ නමුත් එම ඇගයීම් වාර්තාවෙහි මූලික තොරතුරු අන්තර් ගත විය යුතුය. ව්‍යාපෘතියේ ස්වභාවය, විශාලත්වය සහ ණය මුදලේ ප්‍රමාණය අනුව ව්‍යාපෘතියක් කොතරම් දුරට ගැඹුරින් අධ්‍යයනය කළයුතුද යන්න තීරණය කළ යුතු වේ.

5.4. **අයදුම්පත් ප්‍රධාන කාර්යාල මගින් ඉදිරිපත් කිරීම**

සියලුම ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම්පත් ඒ ඒ ණය දෙන ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ සුමක ඒකකය මගින් පමණක් එවිය යුතු අතර, ශාඛා/ප්‍රාදේශීය/පළාත් කාර්යාල මගින් කෙලින්ම ඉදිරිපත් නොකළ යුතුය.

*With Compliments*

*from*

# N D B

# National Development Bank

## Branches

**GAMPAHA**
129, Ja-Ela Road,
Gampaha
Tel: 033-2225051-3

**KALUTARA**
312, Galle Road,
Kalutara - South
Tel: 034-2229680-2

**ANURADHAPURA**
522/C, Maithreipala Senanayake Mw.,
Anuradhapura
Tel: 025-4581142-3

**BADULLA**
242, Pahala Vediya, Badulla
Tel: 055-2231419

**KANDY**
88, Kotugodella Vediya, Kandy
Tel: 08-2228633-5

**KEGALLE**
121/22, Dharmapala Mw.,
Kegalle
Tel: 035-2232535-7

**CHILLAW**
50-52, Skyline Building, Colombo Rd.,
Chillaw
Tel: 032-2220107-8

**MATARA**
Uyanwatta Road,
Matara
Tel: 041-2227161-3

**KURUNEGALA**
No. 06, Rajapihilla Mw.,
Kurunegala
Tel: 031-2224701, 2225341

**NEGOMBO**
456, Main Street,
Negombo
Tel: 031-2233653

**RATNAPURA**
32, Esaviya Mawatha, Ratnapura
Tel: 045-2230910-1

**GALLE**
Sri Gnanobasha Mw.,
Oruppuwatta,
Galle
Tel: 09-2224136, 074-2380788

**PUTTLAM**
104, Kurunegala Road,
Puttlam
Tel: 032-2266032, 2265529

**National Development Bank**
The Achievers Bank
P.O. Box 1825
40, Navam Mawatha, Colombo 02
Tel: 2437701-10, 2437350-3
Fax: 2440262